# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
## සංචාරක අමාත්‍යාංශය
# ජාතික උද්භිද උද්‍යාන දෙපාතර්මේන්තුව
# <u>ලංසු කැඳවීම</u>
## ඉදිකිරීම් ,අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදුකිරීම
## 2021

**01.** ජාතික උද්භිද උද්‍යාන දෙපාතර්මේන්තුවට අයත් පහත ඉදිකිරීම් ,අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා එම කොන්ත්‍රාත් සඳහා ව්‍යාපාරයක් ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී ඇති ආයතන වලින් මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලැබේ.

| අනු අංකය | ඉදිකිරීම් කායර්යේ නම | කොන්ත්‍රාත් අංකය | අවම ICTAD ලියාපදිංචිය | ලංසු ආරක්ෂණ වටිනාකම රු: | ආපසු නොගෙවන ලංසු අයදුම්පත්‍ර ගාස්තුව (රු) |
|---|---|---|---|---|---|
| 1. | මීගලෑව උද්‍යානයේ වගා ළිඳ ඉදිකිරීම | DNBG/F6/Pro/GMG/Agrowell/2021-46 | $C_8$ හෝ $C_7$ ජල සම්පාදන සහ පල්දෝරු හෝ වැසි ජල අපවහනය හෝ වාරි මාගර් සහ ඉඩම් ජලපවහන | 26,000.00 | 3,000.00 |
| 2. | රාජකීය උද්භිද උද්‍යානයේ රථවාහන අංගනයක් සහිත කායර්ාල ගොඩනැගිල්ල ඉදිකිරීම | DNBG/F6/Pro/RBG/Vehicle park & buil/2021-47 | $C_5$ හෝ $C_4$ ගොඩනැගිලි | 330,000.00 | 3,000.00 |

**02.** ලංසු කැඳවීම දීප ව්‍යාප්ත සීමිත ජාතික තරඟකාරී ලංසුකරන පරිපාටියට අනුව සිදු කරනු ලැබේ.මෙහිදී රටේ පවතින සංචරණ සීමා හා කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය සලකා බලා අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත්තුව සිදුකරන අදාල ඒකකය අයත් පළාත තුල සිටින කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**03.** මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2021.08.23 දින සිට 2021.09.13 දින දක්වා කායර්ාල දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා ඒ ඒ කායර්යට අදාල ආපසු නොගෙවන ලංසු අයදුම්පත් ගාස්තුවක් ගෙවා (එක් කට්ටලයක් සඳහා ) ලංසු ආකෘති පත්‍ර පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාතර්මේන්තුවේ ප්‍රධාන කායර්ාලයේ ගිණුම් අංශයෙන් ලබා ගත හැකිය. ලංසු ආකෘති ලබා ගැනීම සඳහා ICTAD/CIDA ලියාපදිංචි පොත (මුල් පිටපත) හා ආයතනයේ ලිපි ශීෂර්යෙන් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කිරීම අනිවායර් වේ.

**04.** ඉහත සඳහන් ලංසු ආරක්ෂණය රජයේ පිළිගත් වාණිජ බැංකුවකින් ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැති නම් එම ලංසු ආරක්ෂණය මුදලින් පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාතර්මේන්තුවේ තැන්පත් කළ හැකිය. ලංසු ලියවිලි සමඟ ලංසු ආරක්ෂණය ඉදිරිපත් කර නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **ලංසු ආරක්ෂණ වටිනාකම ලංසුව විවෘත කරන දිනය වන 2021.09.14 දින සිට ඉදිරියට දින 90 කට ලබාගත යුතුය.)**

**05.** සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුක්තව විධිමත් පරිදි මුද්‍රා තබා (මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර) **2021.09.14 දින පෙ.ව. 10.30** ට පෙර සභාපති, දෙපාතර්මේන්තු මහ පරිමාණ ප්‍රසම්පාදන කමිටුව, ජාතික උද්භිද උද්‍යාන දෙපාතර්මේන්තුව, තැ.පෙ.14, පේරාදෙණිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එම කාර්ය සඳහා මුදල් අංශයේ තබා ඇති මහ පරිමාණ ප්‍රසම්පාදන බහාලුම් පෙට්ටියට දැමිය යුතු වන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුපත් භාරගැනීම අවසන් වූ වහාම ලංසුපත් විවෘත කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක. ලංසුපත් බහා එවන ලියුම් කවරවල වම්පස ඉහළ කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සඳහන් කළ යුතු අතර ඒ ඒ ලිපි කවර වල අදාල කොන්ත්‍රාත් ආයතනයේ ද නම සඳහන් කළ යුතුය.

**06.** ලංසුපත් පිළිබඳ තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය දෙපාතර්මේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලය සතුවන අතර, මෙම නිවේදනයේ හෝ ලංසු ආකෘතින්හි සඳහන් හෝ සඳහන් නොවන මෙම ප්‍රසම්පාදන කාර්යට අදාල කිසියම් කාරණයක් පිළිබඳ තීරණයක් ලබා දීමේ බලය ජාතික උද්භිද උද්‍යාන දෙපාතර්මේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ. ( මේ පිළිබඳ වැඩිමනක් විස්තර 081-2388293 දුරකථනය මගින් මෙම දෙපාතර්මේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ඇමතීමෙන් ලබා ගත හැක.)

සභාපති,
දෙපාතර්මේන්තු මහ පරිමාණ ප්‍රසම්පාදන කමිටුව,
ජාතික උද්භිද උද්‍යාන දෙපාතර්මේන්තුව, පේරාදෙණිය.
**2021.08.20**